# 01 අකුසලින් තොර වෙමු කුසලින් සරු වෙමු

අප ගත කරන මේ සාංසාරික ජීවිතය දුක් දෙම්නස්වලින් මෙන් ම සැප සම්පත්වලින් ද යුක්ත ය. බාල, තරුණ, මහලු කාහට වුව ද විටෙක දුක් කම්කටොලු ද තවත් විටෙක සැප සම්පත් ද ලැබෙයි. එසේ සුව දුක් විඳිමින් අප මේ සසර ගමන් කිරීමට බලපාන හේතු විවිධ ය. බුදුරජාණන් වහන්සේ නොයෙක් විට දේශනා කොට ඇති පරිදි අප ජීවිතය කෙරෙහි බලපාන විවිධ සාධක ඇත. කර්මය ද ඉන් එකකැයි උන් වහන්සේ වදාළ බව නියාම ධර්ම පාඩමේ දී ඔබ උගත්තෙහි ය.

කර්මය යනු ක්‍රියාවයි. කවර ජීවියකුගේ වුව ද ක්‍රියාව කෙරෙන තුන් දෙරක් තිබේ. එකක් සිත ය. එහි උපදනා සිතුවිලි ය. අනෙක කයයි. එනම් දෑත් දෙපා ආදියෙන් කරන කටයුතු ය. තෙවැන්න වචනයයි. අපේ කථාබහයි. මෙකී තුන් දෙරින් කරන ක්‍රියාවෝ කර්ම නමින් හැඳින්වෙති. එහෙත් මේ තිදෙරින් කෙරෙන ඕනෑ ම ක්‍රියාවක් කර්ම නාමයෙන් නොගැනෙන බව අප තේරුම්ගත යුතු ය. බුදු දහම අනුව කර්මය චේතනාව මුල් කොට ඇත්තකි. එනම් සිතා මතා සිදු කරන්නකි.

අප සිත් තුළ මුල්බැස පවත්නා ඇල්ම, ආසාව, ගිජුකම, **රාග චේතනාව** ය. එසේ ම අප තුළ නිදිගත ව ඇති ගැටෙන සුලු බව, විරුද්ධවාදී බව, වෛරය, කෝපය, **ද්වේෂ චේතනාව** ය. මුලාව, රැවටීම, නොමග යාම **මෝහ චේතනාව** ය. එබඳු චේතනාවන් මුල් කොටගෙන සිතින්, කයින් හා වචනයෙන් අප සිදු කරන ක්‍රියාවන් තිබේ. ඒවා අකුසල කර්ම හෝ පාප කර්ම නම් වෙයි. රාගයෙන්, කාමයෙන් තොර වූ යහපත් චේතනාවන් ද අප තුළ උපදවා ගත හැකි ය. ද්වේෂයෙන්, ගැටෙන සුලු බවින් තොර වූ අහිංසක චේතනාවන් ද අප තුළ උපදියි. එසේ ම මෝහයෙන් මුළාවෙන් තොර වූ නුවණ, හරි දැක්ම මුල් කොට ගත් චේතනාවන් ද උපදී. එම කුසල චේතනාවන් මත පිහිටා සිතින් කයින් හා වචනයෙන් අප සිදු කරන ක්‍රියාවෝ කුසල කර්මයෝ වෙත්. චේතනාව මූලික නො වන හෙවත් සිතාමතා නො කරන ක්‍රියා කර්ම ගණයට ඇතුළත් වන්නේ නැත.

ගොවි මහතකු කුඹුරක සී සාද්දී ඔහුට නො දැනී කුඩා සතුන් මරණයට පත්විය හැකි ය. එහෙත් ඒ හේතුවෙන් ඔහු ප්‍රාණඝාත අකුසල කර්මයක් සිදුකරගෙන ඇතැයි කිව හැකි නො වේ. ඊට හේතුව සතුන් මැරීමේ චේතනාවෙන් ඒ ගොවි මහතා ක්‍රියා කොට නො තිබීම ය.

සති පොළකට ගිය අයකුට මිලට ගත් එළවළු බෑගය තමා ගමන් කළ බස් රිය තුළ අමතක වූයේ යැයි සිතමු. වෙනත් අයෙක් අයිතිකරුවකු නැති එම එළවළු බෑගය රැගෙන යයි. එහෙත් එහි දී එළවළු බෑගයේ හිමිකරු තුළ එය අනෙකකුට පරිත්‍යාග කිරීමේ චේතනාවක් නොතිබිණ. ඒ අනුව ඔහු කුසල කර්මයක් සිදු කොට ඇතැයි කිව හැකි නො වේ.

කුඹුරට ගිය ගොවියා එහි නියර මත දී හෝ වෙනත් තැනක දී හිතාමතා ම මේ සතා මරමි යි යම් සතකු දිවි තොර කෙළේ නම් එය අකුසල කර්මයක් ම වේ. ඔහු තුළ පරපණ නැසීමේ චේතනාව තිබූ බැවිනි. සති පොළට ගිය තැනැත්තා එහි දී හෝ වෙනත් තැනක දී හෝ දිළිඳු තැනැත්තකු දැක ඔහුට ද මිලට ගත් එළවළුවලින් කොටසක් සිතාමතා ම පරිත්‍යාග කෙළේ නම් එය කුසල කර්මයක් ම වේ. ඔහු තුළ දන චේතනාව තිබූ බැවිනි.

බුදු දහම අනුව යම් ක්‍රියාවක් අකුසල කර්මයක් ලෙස හෝ කුසල කර්මයක් ලෙස හෝ තීරණය කිරීමේ දී චේතනාව විමසා බැලිය යුතු ය. එසේ ම යම් ක්‍රියාවක් අකුසල කර්මයක් ලෙස හෝ කුසල කර්මයක් ලෙස හෝ නිශ්චය කිරීමේ දී එම ක්‍රියාවෙහි ප්‍රතිඵල ද සලකා බැලිය යුතු ය. සිතින්, කයින් හෝ වචනයෙන් අප විසින් කරනු ලබන යම් ක්‍රියාවක් නිසා දෙලොව ම දුක් පීඩා විඳීමට සිදු වේ නම් එය අකුසල කර්මයකි. සිතින්, කයින් හෝ වචනයෙන් අප විසින් කරනු ලබන යම් ක්‍රියාවක් නිසා දෙලොව ම සැප විඳීමට හැකි වේ නම් එය කුසල කර්මයකි. යම් ක්‍රියාවක් කොට පසුව කඳුළු පිරුණු මුහුණින් තැවීමට දුක් වීමට සිදුවන්නේ නම් එය නරක ය. යම් ක්‍රියාවක් කොට පසුව සතුටින් එම ක්‍රියාවෙහි යහපත් ප්‍රතිඵල භුක්ති විඳීමට හැකි වේ නම්, එය හොඳ යැ'යි බුදු දහම උගන්වයි.

කුසලාකුසල කර්මයන්ගේ ඵල විපාක පිළිබඳ ව දේශනා කළ බුදුරජාණන් වහන්සේ එහි දී තමා ගැන මෙන් ම අනුන් ගැන ද සිතා බැලිය යුතු යැ'යි ඉගැන්වූහ. සිතින්, කයින් හෝ වචනයෙන් අප විසින් කරනු ලබන යම් ක්‍රියාවක් තමාගේ මෙන්ම අනුන්ගේ ද අහිත' අවැඩ පිණිස හේතු වෙයි නම්, එය අකුසල කර්මයකි. තුන් දෙරින් කරන යම් ක්‍රියාවක් තමාගේ මෙන්ම අනුන්ගේ ද හිත සුව පිණිස හේතු වෙයි නම්, එය කුසල කර්මයකි. සත්ත්ව ඝාතනය, සොරකම ආදි කවර අකුසල ක්‍රියාවකින් වුව ද තමාට අවැඩක් ම සිදු වේ. අනුන්ට ද අවැඩක් ම සිදු වේ. එබඳු අකුසල ක්‍රියාවලින් වෙන් වී සියලු සත්ත්වයන්ට මෙත් සිත පැතිරවීම, කවරකුට වුව ද යමක් පරිත්‍යාග කිරීමාදී කුසල ක්‍රියාවකින් තමාට යහපතක් ම සිදු වෙයි. අනුන්ට ද යහපතක් ම සිදු වෙයි.



**හොඳ පින්කමක්**

අප විසින් කරනු ලබන කුසලාකුසල කර්මයන්ගේ වගකීම අප විසින් ම දැරිය යුතු ය. එය අන් අයකුට පැවරීම කිසිසේත් ම කළ හැකි නො වේ. පවිටු චේතනාවෙන් යුතුව කළ කී දේ ගැලෙහි බැඳි ගොනු පසුපස ම එන ගැල් රෝදය මෙන් කළ තැනැත්තා පසුපස ම ඇදී එයි. ඒ අකුසල කර්මයට ඔහු ම වගකිව යුතු ය. එයින් ඔහුට ම දුක් විඳීමට සිදු වන්නේ ය. යහපත් චේතනාවෙන් යුතු ව කළ කී දේ සෙවණැල්ල ලෙස අප අත් නොහැර අප පසුපස ම ඇදී එයි. ඒ කුසල කර්මයේ ආනිසංසය අපට ම ලැබේ. කුසල කර්ම කළ තැනැත්තාට එයින් සැප විපාක ලද හැකි ය.

කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අනුව යමකු පව්කම් කළ ද පසු ව ඒ පව්කම් හි ආදීනව දැක එබඳු ක්‍රියාවලින් වැළකී කුසල් වඩා ගත්තේ නම් හෙතෙම ලෝකය ආලෝකවත් කරයි. ඔහුට සසර දුක් කෙළවර කරගත හැකි ය. එබැවින් කරන ලද පාප ක්‍රියාවන් පිළිබඳ ව පසුතැවිලි නොවිය යුතු ය. කුසල් දහම් වැඩිය යුතු ය. පවට බිය ඇති, කුසලයට ලැදි, ජීවිතයක් ගොඩ නඟා ගැනීමේ දී කර්මයෙහි ප්‍රභේද හෙවත් විවිධ කර්ම වර්ග පිළිබඳ දැන ගැනීම ද ප්‍රයෝජනවත් වෙයි. බුදු දහමෙහි කර්මය පිළිබඳ ප්‍රභේද රාශියක් දක්වා තිබේ.

විපාක දෙන කාලය අනුව කර්මය සතරාකාර වේ.

1. දිට්ඨධම්මවේදනීය කර්මය
2. උපපජ්ජවේදනීය කර්මය
3. අපරාපරියවේදනීය කර්මය
4. අහෝසි කර්මය

යනුවෙනි.

මෙ ලොව දී ම විපාක දෙන්නේ **දිට්ඨධම්මවේදනීය කර්ම** වේ. එම කුසල කර්මය හෝ අකුසල කර්මය හෝ ප්‍රවෘත්ති විපාක ලබා දෙන්නකි. එය ප්‍රතිසන්ධි විපාක ඉපදවීමෙහි අසමත් ය. ප්‍රතිසන්ධි විපාක නම් මරණින් පසු යළි ඉපදීම සඳහා කරනු ලබන බලපෑමයි. ප්‍රවෘත්ති විපාක නම් උපන්දා සිට මරණය තෙක් සිදුවන බලපෑමයි. දෙවන ආත්ම භාවයේ දී විපාක දෙන කර්මය **උපපජ්ජවේදනීය** නම් වේ. එම කුසලාකුසල කර්මයෝ ප්‍රවෘත්ති විපාක මෙන්ම ප්‍රතිසන්ධි විපාක ද ලබා දීමට සමත් වන්නෝ ය. කවර හෝ ආත්මභාවයක දී විපාක දෙන කර්මය **අපරාපරියවේදනීය** නම් වේ. සසර දුකින් අත්මිදී නිවන් දක්නා තෙක් ම විපාක ලබා දීමට එම කර්මය සමත් වෙයි. මතුවට විපාක නොදී අහෝසි වී යන කර්ම **අහෝසි කර්මයි**. කර්ම ශක්තිය යටපත් කරමින් පිළිවෙත් පුරා රහත් බවට පත් වී පිරිනිවන් පෑ විට ඒ උතුමා විසින් පෙර කරන ලද කර්මයෝ එසේ අහෝසි වී යන්නෝ ය.

විපාක දෙන ආකාරය අනුව ද කර්මය සතරාකාර වෙයි.

1. ගරුක කර්මය
2. ආසන්න කර්මය
3. ආචිණ්ණ කර්මය
4. කටත්තා කර්මය

යනුවෙනි.

වෙනත් කර්මයකින් වළකාලිය නො හැකි වඩාත් ශක්තිමත් බරපතල කුසලාකුසල කර්මයෝ **ගරුක කර්ම** නාමයෙන් හැඳින්වෙති. පඤ්චානන්තරිය කර්ම හා නියත මිථ්‍යා දෘෂ්ටිය ද ගරුක අකුසල කර්ම වේ. රූපාවචර අරූපාවචරාදී ධ්‍යාන උපදවා ගැනීම ගරුක කුසල කර්ම වේ. මරණාසන්න අවස්ථාවේ දී කරන ලද හෝ සිහියට නැගෙන ලද හෝ කර්මය **ආසන්න කර්ම** නම් වේ. ගරුක කර්මයක බලපෑමක් නැති විටෙක දෙවන භවයෙහි ප්‍රතිසන්ධිය ලබා දීමට **ආසන්න කර්මය** බලපායි. නිතර නිතර පුරුද්දක් මෙන් කරන ලද කුසලාකුසලයෝ **ආචිණ්ණ කර්ම** නම් වෙති. ගරුක, ආසන්න කර්මවල බලපෑමක් නැති විටෙක ප්‍රතිසන්ධිය ලබා දීමට ආචිණ්ණ කර්මය බලපායි. දුර්වල වූ කුසලාකුසල කර්මයෝ **කටත්තා කර්මයෝ** ය. ගරුක, ආසන්න, ආචිණ්ණ කර්මවල බලපෑමක් නැති විටෙක කටත්තා කර්මය ප්‍රතිසන්ධිය ලබා දීමෙහි සමත් වෙයි.

කෘත්‍ය හෙවත් කාර්යයන් අනුව ද කර්මය සතරාකාර වෙයි.

1. ජනක කර්මය
2. උපත්ථම්භක කර්මය
3. උපපීළක කර්මය
4. උපඝාතක කර්මය

යනුවෙනි.

සත්ත්වයාගේ ප්‍රතිසන්ධිය ලබා දීමෙහි සමත් වන්නෝ **ජනක කර්මයෝ** ය. ජනක අකුසල කර්මය සතර අපාය ආදි දුක් ඇති තන්හි ද, ජනක කුසල කර්මය දෙව් ලොව මිනිස් ලොව ආදි සැප ඇති තන්හි ද උපත ලබා දීමට බලපායි. ජනක කර්මයට අනුබල දෙන එම කුසලාකුසල කර්මයන්ට රුකුල් දෙන කර්මය **උපත්ථම්භක කර්මයයි.** කුසලාකුසල වශයෙන් දෙයාකාර වන මෙම කර්මය ප්‍රවෘත්ති විපාක ලබා දෙන්නකි. ජනක කර්මයට බාධා පමුණුවන එහි බලය හීන කරවන කර්මය **උපපීළක කර්මයයි.** උපපීළක අකුසල කර්මය ජනක කුසල කර්මයට ද උපපීළක කුසල කර්මය ජනක

අකුසල කර්මයට ද හානි කරයි. ජනක කර්මයාගේ විපාක දීමේ හැකියාව නැති කොට තමා ම විපාක ලබා දෙන කර්මය **උපඝාතක** නම් වේ. උපඝාතක අකුසල කර්ම ජනක කුසල කර්මයේ ද උපඝාතක කුසල කර්ම ජනක අකුසල කර්මයේ ද විපාක දීමේ ශක්තිය නැති කරයි.



**කළ පින් බලෙන් දෙව්ලොව ඉපිද**

සසර තුළ දුක් සැප ලබා දීමෙහි සමත් වන, සිතුවිලි මුල් කොට ගත්, ලෝකයෙහි විවිධ විසමතාවන් ඇති කරන, අපගේ ම වගකීමට යටත් වන කර්මය පිළිබඳ මනා අවදිකමකින් ජීවත් වීමට අප සැබවින් ම යොමු විය යුතු ය. ජීවිතය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වන එහි විවිධ ප්‍රභේද ඇති බව ද තේරුම් ගත යුතු ය. පාසල් දරුවන් වන අපි අපගේ ජීවිතයේ සාර්ථකත්වය, සැනසිල්ල, සතුට හා දියුණුව සඳහා අපගේ ම තුන් දෙරින් ක්‍රියාවට නැගෙන කුසලාකුසල කර්ම පිළිබඳ ව නිරතුරු සැලකිලිමත් වෙමු. අකුසල කර්මයන්ගෙන් වැළකී කුසල කර්මයන් හි නිරත වීමෙන් යහපත් ප්‍රතිඵල උදාකර ගනිමු.

## සාරාංශය

කර්මය බුදු දහමෙහි එන ප්‍රධානතම ඉගැන්වීමකි. අපගේ ජීවිතය කෙරෙහි බලපාන දුක් සැප උපදවන ඉතා වැදගත් සාධකයක් වන එය අපගේ ම චේතනා මුල් කොටගෙන සිත කය වචන යන තිදෙරින් ම ක්‍රියාත්මක වෙයි. ලෝකයෙහි විවිධ උස්පහත්කම්වලට ද එක් හේතු සාධකයක් වන්නේ කර්මයයි. එබැවින් අකුසල කර්මයන්ගෙන් ඈත් වීමත් කුසල කර්මයන්හි නිරත වීමත් මෙලොව පරලොව යහපත පිණිස ම හේතුවන බව තේරුම් ගෙන අපි ක්‍රියා කරමු.

## ක්‍රියාකාරකම්

01. චේතනාව අනුව යම් ක්‍රියාවක් කුසලයක් හෝ අකුසලයක් හෝ වන ආකාරය පෙන්වා දෙන්න.

02. කර්ම ඵල විශ්වාසය පුද්ගලයාගේ හා සමාජයේ යහපත සලසන අයුරු පැහැදිලි කරන්න.

03. මෙම පාඩමෙහි සඳහන් වන කර්ම ප්‍රභේද වගු ගත කර පෙන්වන්න.

## පැවරුම

ධර්මධරයකු සමග සාකච්ඡා කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයා පන්තියට ඉදිරිපත් කරන්න.

01. දෙව්දත් තෙර, අජාසත්, මට්ටකුණ්ඩලී, චුන්දසූකරික යන අයගේ මරණින් මතු උපතට බලපෑ කර්ම මොනවා ද?

02. ඒවා විපාක දෙන ආකාරය අනුව වෙන වෙන ම නම් කරන්න.